ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා
ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

ඊමේල් : info@cida.gov.lk    වෙබ් අඩවිය : www.cida.gov.lk

# පුරප්පාඩු

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.**

## 01. අධ්‍යක්ෂ ජනරාල් - ජ්‍යෙෂ්ඨ කළමනාකාර කාණ්ඩය HM 2-1 (තනතුරු 01)

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු/ වාස්තු විද්‍යා/ ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

**සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) / ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය (SLIA) / ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් අදාළ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

අදාල ක්ෂේත්‍රයේ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ රජයේ පිළිගත හැකි ආයතනයක ප්‍රධාන ඉදිකිරීම් කටයුතුවල සියලුම පුළුල් ක්ෂේත්‍රවල ''කළමනාකරණ මට්ටමක'' වසර 20 ක අවම පළපුරුද්දක් ලබා තිබීම සහ ඉන් වසර 05 ක් ''ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ'' පළපුරුද්දක් ලබා තිබීම හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් පිළිගත් පුද්ගලික ආයතනයක සනාථ කළ හැකි පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු/ වාස්තු විද්‍යා/ ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාවේදී උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධිය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL)/ ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය (SLIA)/ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් අදාළ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සමඟ**

(a) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර හතක (07) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සහ**

(b) බහුවිධ විෂයයන්ගෙන් යුත් කණ්ඩායම්වලට නායකත්වය ලබා දීමට සහ මග පෙන්වීමට හැකි බවට සනාථ කළ හැකියාව. මානව සහ වෙනත් සම්පත් නිසි ලෙස යෙදවීමේ සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ පළපුරුද්දක් ලබා තිබීම.

- **වයස :**

වයස අවුරුදු 35 ට නො අඩු සහ 55 ට නොවැඩි විය යුතු ය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ රාජ්‍ය/ සංස්ථා අංශයේ අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- **වැටුප් පරිමාණය :**

2016.01.01 සිට බලපැවැත්වෙන පරිදි,

HM 2-1 රු. 93,020/- 12 x 2,700/- 125,420/-

## 02. අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පාලන) - HM 1-3- (තනතුරු 01)

**සුදුසුකම් සහ පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සමඟ**

මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලය/ රජයේ ආයතනයක ''කළමනාකරණ මට්ටමක'' වසර 15 ක අවම පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරු (MM-1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වැටුප් පරිමාණය :**

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩය (HM 1-3)

HM 1-3 - රු.86,865/ - 15 x 2,270/- 120,915/-

- **වයස :**

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩය (HM 1-3)

වයස අවුරුදු 35 ට නො අඩු සහ 55 ට නොවැඩි විය යුතු ය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සහ රාජ්‍ය/ සංස්ථා අංශයේ අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

---

- **පත්වීමේ ස්වභාවය :**

සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) සඳහා හිමිකම් ඇති ස්ථිර පත්වීමකි.

සෑම අයදුම්කරුවෙකුම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතු ය.

- **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

සම්මුඛ පරීක්ෂණය සඳහා වෙන් කළ ලකුණු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ■ අදාළ අමතර පළපුරුද්ද | - | ලකුණු 30 |
| ■ අදාළ අමතර අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| ■ වෙනත් ජයග්‍රහණ | - | ලකුණු 15 |
| ■ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | - | ලකුණු 25 |
| | | ලකුණු 100 |

**පත්වීම හුදෙක්ම ලබා දෙනුයේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා අනුපිළිවෙළ අනුව ය.**

- **වෙනත් ප්‍රතිලාභ**

➢ රජයේ අනුමත දීමනා.

➢ සීඩා(CIDA) විසින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) වෙත වැටුපෙන් 15% හා 3% ක් දායක කරනු ඇති අතර සේවකයා විසින් වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත.

➢ ප්‍රසාද දීමනා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව ලබා දෙනු ඇත.

➢ වෛද්‍ය රක්ෂණාවරණ පහසුකම්.

➢ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුව ප්‍රවාහන පහසුකම්/ දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය සිදු කෙරෙනු ඇත.

අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්දට අදාළ සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2022.01.24** දිනට පෙර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වෙත එවිය යුතු ය. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයන් / ආයතනයේ ස්ථිර සේවකයන් නම් අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු අතර තෝරාගනු ලැබුවහොත් අදාළ තනතුරින් මුදා හැරිය හැකි බව දැක්විය යුතු ය. අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ දැක්විය යුතුය.

අනෙකුත් සියලු තොරතුරු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියේ ඇත www.cida.gov.lk

**නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද/ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරන ලද සුදුසුකම්ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.**

**සභාපති**

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**" සව්සිරිපාය" 123, විජේරාම මාවත,**
**කොළඹ 07.**
**විද්‍යුත් තැපෑල - සභාපති (CIDA)- ch@cida.gov.lk**